# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. පන්තිය - 8 ශ්‍රේණිය විෂයය - සිංහල අදාළ සතිය - සැප්තැම්බර් 5 සතිය

2. පාඩම් හෝ ඒකකය - 18 වාක්‍ය රීති II

3. ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

   I. පාඩම හොඳින් කියවන්න.
   II. වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කියවෙන පදය උක්තය බව හඳුනා ගන්න.
   III. වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් නොකියවෙන පදය අනුක්තය බව හඳුනා ගන්න.
   IV. නාම පදයකට උක්ත හා අනුක්ත රූප පවතින බව හඳුනා ගන්න.
   V. සර්ව නාම පද, ප්‍රාණවාචී බහු වචන නාම පද, අනියමාර්ථ නාම පද වල උක්ත හා අනුක්ත රූප හඳුනා ගන්න.
   VI. වාක්‍ය නිර්මාණයේ දී උක්ත හා ආඛ්‍යාත පද සම්බන්ධය වැදගත් වන බව පාඩම කියවා අවබෝධ කර ගන්න.
   VII. e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදි ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙනගන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   I. e නැණපියස -
      - https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=10426

   II. ගුරු ගෙදර -
      - https://www.youtube.com/watch?v=woDdVx6XCAs

   III. වෙනත් - යූ ටියුබ්
      a. (381) 8 වසර 18 වන පාඩම වාක්‍ය රීති 2 - YouTube
      b. https://www.youtube.com/watch?v=28J5y1lSkS4

   IV. අතිරේක පොත් / සඟරා -
      a. සිංහල භාෂාව හා ව්‍යාකරණය - රත්න කොඩිකාර
      b. සිංහල භාෂාව හා සාහිත්‍යය - එස්.ඕ.ප්‍රනාන්දු

5. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල
   I. වාක්‍යයක ක්‍රියාව කරන්නා උක්තය බව හඳුනා ගනියි.
   II. වාක්‍ය වල උක්ත හා අනුක්ත පද ලියා දක්වයි.
   III. වාක්‍ය නිර්මාණයේ දී උක්තයට අනුව ආඛ්‍යාතය තබා ලියයි.
   IV. භාෂා භාවිතයේ දී උක්ත හා ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි ශිල්ප ක්‍රමයක් බව හඳුනා ගනියි.
   V. නිවැරදි ශිල්පීය දක්ෂතා සහිතව ලිවීම භාෂාවේ වැදගත් අංගයක් බව අන් අය සමග ප්‍රකාශ කරයි.

6. ඇගයීම හා තක්සේරුව
   I. පහත වගුවෙහි හිස් තැන් පුරවන්න.

| සර්ව නාම පද | | ප්‍රාණවාචී බහු වචන නාම පද | | අනියමාර්ථ නාම පද | |
|---|---|---|---|---|---|
| උක්ත | අනුක්ත | උක්ත | අනුක්ත | උක්ත | අනුක්ත |
| මම | | ගොවියෝ | | ක්‍රීඩකයෙක් | |
| | අප | | ගිරවුන් | | ඇතෙකු |
| | තා | ඇත්තු | | නිළියක් | |
| තොපි | | ළමයි | | | ගැහැනියක |
| නුඹ | | | ගුරුවරුන් | මලක් | |
| | නුඹලා | ක්‍රීඩකයෝ | | ගෙයක් | |
| ඔහු / හේ | | | සොරුන් | | පොතක් |
| | ඇය/ඈ | | බල්ලන් | | පැනක් |

   II. පාඩමේ ලිඛිත අභ්‍යාස 2 ට පිළිතුරු සපයන්න.